74

# බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය
## மேல் மாகாண ஆளுநர் பணிமனை
## GOVERNOR'S OFFICE - WESTERN PROVINCE

අංක 204, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත,
බත්තරමුල්ල.

இல. 204, டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்ல.

No. 204, Denzil Kobbekaduwe Mawatha
Battaramulla.


ඔබේ අංකය. / உமது இல. / Your Ref. CSWP/ADM/30-38/FI/2024

මගේ අංකය / எனது இல. / My Ref. GOS/ADM/6/2/19

දිනය / திகதி / Date 2024.06.06

"ජනතා හිතවාදී විශිෂ්ටතම පළාත් රාජ්‍ය සේවාවක්" -" பொது மக்களுக்கு சிறந்த பொதுச் சேவை " -" People Friendly Excellent Public Service "

පාලන අංශය
110133
07 JUN 2024
ADM-30

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය
බස්නාහිර පළාත.

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ ( මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.**

උක්ත මැයෙන් යුතුව මා අමතන ලද ඔබේ සමාංක හා 2022.02.29 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව පහත සඳහන් චක්‍රලේඛයන් පවතින ආකාරයෙන්ම බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.

| චක්‍රලේඛ අංකය | චක්‍රලේඛ නිකුත් කළ දිනය | කාරණය |
|---|---|---|
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2024 | 2024.04.16 | වයස අවුරුදු 45න් පසුව පත්වීම් ස්ථිර කරන ලද සේවකයින් වෙත විශ්‍රාම වැටුප් ලබා දීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014, 25(2014)(1) සහ 29/2019 සම්බන්ධයෙනි |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99(XL) | 2024.04.25 | රජයේ නිලධරයන්/ පලාත් රාජ්‍ය නිලධරයන්/ අධිකරණ නිලධරයන් සඳහා නිල ප්‍රවාහන පහසුකම |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021(IX) | 2024.05.07 | COVID 19 වසංගත සමය තුල විදේශ ගතව සිට පැවති තත්ත්වය හමුවේ නැවත සේවයට වාර්තා කිරීමට අපොහොසත්ව සිටි රාජ්‍ය නිලධරයන් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම. |
| සෞඛ්‍ය අමාත්‍යාංශය පොදු චක්‍රලේඛ 02-55/2024 | 2024.04.02 | සෞඛ්‍ය අංශයේ කාර්යය මණ්ඩලය සඳහා නිල ඇඳුම් දීමනා සංශෝධනය |
| සෞඛ්‍ය අමාත්‍යාංශය පොදු චක්‍රලේඛ 02-61/2024 | 2024.04.08 | රජයේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන් සඳහා රාජකාරී බාධා පැමිණ සිටීමේ හා ප්‍රවාහන දීමනා (DAT) ගෙවීම සංශෝධනය කිරීම |

සෝමසිරි පල්ලත්තරගේ
ආණ්ඩුකාර ලේකම්
බස්නාහිර පළාත


දුරකතන අංක - 0112-092816
ෆැක්ස් - 0112-092813
විද්‍යුත් තැපැල - governoroffice@secgov.wp.gov.lk

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 02/2021(IX)

මගේ අංකය : EST-6/03/LEA/3381(විදේශ 1)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2024.05.07

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**COVID -19 වසංගත සමය තුළ විදේශගතව සිට පැවති තත්ත්වය හමුවේ නැවත සේවයට වාර්තා කිරීමට අපොහොසත්ව සිටි රාජ්‍ය නිලධරයන් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම**

COVID - 19 වසංගත සමය තුළ විදේශගතව සිට COVID -19 වසංගත තත්ත්වය හේතුවෙන් නියමිත දිනට නැවත සේවයට වාර්තා කිරීමට අපොහොසත්ව සිටි රජයේ නිලධරයන්ගේ නිවාඩු සම්බන්ධයෙන් පහත විධිවිධාන අනුව කටයුතු කිරීමට 2024.03.25 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

(i) ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 14, 22 හා 23 වගන්ති යටතේ විදේශ නිවාඩු ලබා, 2020 වර්ෂයේ පැමිණීමට නියමිතව තිබී 2020.12.31 දින හෝ ඊට ප්‍රථම හෝ දිවයිනට පැමිණ සේවයට වාර්තා කර ඇති නිලධරයන්ට අනුමත නිවාඩු කාල සීමාවෙන් ඔබ්බට ලබාගෙන ඇති නිවාඩු, වැටුප් සහිත විදේශ නිවාඩු වශයෙන් අනුමත කිරීම.

(ii) ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 16 හා 36 වගන්ති යටතේ විදේශ නිවාඩු ලබා, 2020 වර්ෂයේ පැමිණීමට නියමිතව තිබී 2020.12.31 දින හෝ ඊට ප්‍රථම හෝ දිවයිනට පැමිණ සේවයට වාර්තා කර ඇති නිලධරයන්ට අනුමත නිවාඩු කාල සීමාවෙන් ඔබ්බට ලබාගෙන ඇති නිවාඩු, වැටුප් රහිත විදේශ නිවාඩු වශයෙන් අනුමත කිරීම.

(iii) 2020 සහ 2021 වර්ෂවල පැමිණීමට නියමිතව තිබී 2020.12.31 දිනෙන් පසු හා 2021.12.31 දින හෝ ඊට ප්‍රථම හෝ දිවයිනට පැමිණ සේවයට වාර්තා කර ඇති නිලධරයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී දිවයිනට පැමිණීමට නිලධරයා විසින් ප්‍රමාණවත් උත්සාහයක් දරා ඇති බවට සනාථ කෙරෙන ලියකියවිලි ඉදිරිපත් කර ඇති නිලධරයන්ට අනුමත නිවාඩු කාල සීමාවෙන් ඔබ්බට ලබාගෙන ඇති නිවාඩු, වැටුප් රහිත නිවාඩු වශයෙන් අනුමත කිරීම.

එහි දී ගුවන්තොටුපල වසා තිබූ බව හෝ ගුවන් ගමන් වාර අවලංගු කර තිබූ බවට වන ලිපි ලේඛන නිවාඩු අනුමත කරන බලධරයා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව විධිමත් පරිදි නිවාඩු අනුමතිය ලබා ගත යුතු ය. එම ලිපි ලේඛන ලබා ගැනීමේ දී නිවාඩු ලබා ගන්නා ලද නිලධරයා විසින් හෝ සේවය කරනු ලබන ආයතනයේ මැදිහත්වීමකින් හෝ ලබා ගෙන තිබිය යුතු ය.

(iv) 2020 සහ 2021 වර්ෂවල පැමිණීමට නියමිතව තිබී 2021.12.31 දින හෝ ඊට ප්‍රථම හෝ දිවයිනට පැමිණ සේවයට වාර්තා කර ඇති ඉහත අනු අංක (ii) හා (iii) හි යෝජිත පරිදි නිවාඩු අනුමත කරගෙන ඇති නිලධරයන්ට එම කාල සීමාව වැටුප් වර්ධක, නිර්බාධක උසස්වීම්, ජ්‍යෙෂ්ඨතාවට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන සේවා කාලයක් ලෙස සැලකීම.

(v) 2020 සහ 2021 වර්ෂවල පැමිණීමට නියමිතව තිබී 2022 වර්ෂය තුළ හෝ ඉන්පසු සේවයට වාර්තා කර ඇති නිලධරයන්ට වැටුප් රහිත නිවාඩු අනුමත කිරීමටත්, එකී වැටුප් රහිත නිවාඩු කාලය වැටුප් වර්ධක, නිර්බාධක උසස්වීම්, ජ්‍යෙෂ්ඨතාවට හා විශ්‍රාම වැටුපට අදාළ නොවන සේවා කාලයක් ලෙස සැලකීම.

(vi) අනු අංක (i), (ii), (iii) හා (v) යටතේ දක්වා ඇති නිලධරයන් ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 14 හා 16 වගන්ති යටතේ අනුමත විදේශ නිවාඩු කාල සීමාවෙන් ඔබ්බට ලබා ගෙන ඇති විදේශ නිවාඩු එම නිලධරයන්ගේ අනිවාර්ය සේවා කාලයට බල නොපාන අයුරින් අනුමත කිරීම.

(vii) විධිමත් නිවාඩු අනුමතියකින් තොරව සේවයට වාර්තා නොකිරීම නිසා සේවය හැරයාමේ නිවේදන මෙතෙක් නිකුත් නොකළ සියලුම නිලධරයන්ට සේවය හැරයාමේ නිවේදන නිකුත් කිරීම.

02. ඉහත විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම ආයතන ප්‍රධානීන් විසින් වගබලා ගත යුතු ය.

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112-699399
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : ade-vi@pubad.gov.lk